# සාරාංශය

ගණිකා වෘත්තිය යන්න ලෝකයේ පැරණි ම වෘත්තියක් සේ සැලකේ. එ වැන්නක් ශ්‍රී ලංකාවේ ද පැවැති බව යම් යම් සාහිත්‍යමය මූලාශ්‍ර ගවේෂණයෙන් තේරුම් ගත හැකි ය. පැරණි ග්‍රීසිය, රෝමය, එංගලන්තය වැනි බොහෝ රටවල සමලිංගික සම්බන්ධතා පැවති බවට සාක්ෂි සොයා ගත හැකි වුව ද ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ එ වැන්නක් පැවති බවට සාක්ෂි නොමැත. එසේ වුව ද දශක කිහිපයක සිට පිරිමි ළමා ගණිකා වෘත්තියක් වර්ධනය වෙමින් පවතින අතර මේ වන විට එය සමාජ ප්‍රශ්නයක් බවට පත් ව තිබේ. සමාජ ප්‍රශ්නයක මූලික ලක්ෂණයක් වන්නේ එය අනෙකුත් සමාජ ප්‍රශ්න සමඟ සම්බන්ධතාවක් දැක්වීම යි. මත් ද්‍රව්‍ය ආසක්තිය හා HIV/AIDS වැනි ලිංගික සංස්පර්ශක රෝග ව්‍යාප්තිය සමඟ එය සෘජුව ම සම්බන්ධ බව නොයෙකුත් පර්යේෂණවලින් අනාවරණය වී ඇත. එයින් පැහැදිලි වන්නේ මෙය හුදු ළමා පරපුර මුහුණ දී ඇති ප්‍රශ්නයක් පමණක් ම නො ව සමස්ත සමාජයට ම මුහුණ දෙන්නට සිදු වී ඇති ප්‍රශ්නයක් වශයෙන් හඳුනා ගත යුතු බවකි.

පිරිමි ළමා ගණිකා වෘත්තිය හා සම්බන්ධ මෙම සමාජවිද්‍යාත්මක අධ්‍යයනය සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර වෙරළ කලාපය ආශ්‍රයෙනි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පිරිමි ළමා ගණිකා වෘත්තිය කෙරෙහි බලපානු ලබන සමාජ-ආර්ථික හේතු සාධක කවරේ දැ යි සොයා බැලීම ය. එහි දී කඩිනම් ඇගයුම් ක්‍රමය (rapid assessment method) භාවිත කළ අතර එයට අනුරූප වන පරිදි ගණිකා වෘත්තියෙහි නියුතු පිරිමි ළමුන් 60 දෙනෙකු සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්වීම (ප්‍රශ්නාවලියක් යොදා ගනිමින්), නිරීක්ෂණය, සිද්ධි අධ්‍යයනය, ප්‍රධාන දත්ත දායකයින් (key informants) සමඟ සාකච්ඡා පැවැත්වීම යන ක්‍රම මඟින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මෙයට අමතර ව ද්විතීයක දත්ත පරිශීලනය ද කරන ලදී.

ශ්‍රී ලංකාවේ පිරිමි ළමා ගණිකා වෘත්තිය පිළිබඳ අධ්‍යයන සීමිත ය. මේ කෙරෙහි බලපා ඇතැ යි සැලකිය හැකි හේතු කීපයකි. මෙම වෘත්තිය ඉතා රහසිගත අයුරින් පවත්වා ගෙන යාම, පිරිමි ළමුන් සම්බන්ධයෙන් සමාජීය හා සංස්කෘතික වශයෙන් පවත්නා ආකල්ප මෙන් ම ඒ සම්බන්ධයෙන් පර්යේෂණය කරන්නන්ට මුහුණ දීමට සිදු විය හැකි අනතුරුදායක තත්ත්වයන් ආදිය ඒ අතර කැපී පෙනේ.

පිරිමි ළමා ලිංගික වෘත්තිකයන් සම්බන්ධයෙන් සිදු කළ මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වූයේ ආර්ථික සාධකවලට සාපේක්ෂ ව සමාජීය සාධක එකී වෘත්තියක් පැවතීම කෙරෙහි තීව්‍ර ලෙස බලපා ඇති බව කි. ඒ අතර විවාහ සංස්ථාව තුළ

පවත්නා අර්බුධකාරී තත්ත්වයන්, විස්තෘත පවුල් ක්‍රමය බිඳ වැටීම, පවුල මගින් ඉටු විය යුතු ළමා සමාජානුයෝජනය දුර්වල වීම හා එයට සාපේක්ෂ වශයෙන් අපගාමී සමවයස් කාණ්ඩ මගින් දුෂ්සමාජානුයෝජනය වීම, ළමයා අවට පරිසරය නුසුදුසු තත්ත්වයක පැවතීම හේතුවෙන් අධ්‍යාපනික රඟ දැක්ම (performance) දුර්වල වීම, ළමයා ලිංගික අපයෝජනයකට ගොදුරු වී තිබීම, පවුල් හා පාසැල් පරිසරය තුළින් නීරස අත්දැකීම් ලැබීම, අධ්‍යාපනය අතරමඟ නතර වීම ආදිය ගණිකා වෘත්තිය කෙරෙහි අභිප්‍රේණය වීම කෙරෙහි බලපා ඇති මූලික කරුණු වේ. මෙයට අමතර ව සංචාරක කර්මාන්තය ඔස්සේ ළමා ගණිකා වෘත්තියට වැඩි ඉල්ලුමක් තිබීම, එ මගින් ආකර්ශණීය ප්‍රතිලාභ ලැබීම, වැනි ඇද ගන්නා සුලු සාධක අඩු වැඩි වශයෙන් බලපා ඇත. මෙයින් පැහැදිලි වන්නේ ළමා ගණිකා වෘත්තිය යන්න බහුවිධ හේතුකාරකත්වයක (multiple causation) ප්‍රතිඵලයක් බව යි. මේ සියලු සාධක අතර නෛතික ක්‍රියාකාරිත්වයේ පවත්නා උදාසීන තත්ත්වය එකී වෘත්තියේ පැවැත්ම කෙරෙහි වාසිදායක අයුරින් බලපා ඇති බව ද පෙනේ.

පර්යේෂණයේ ප්‍රතිඵලවලින් පැහැදිලි වන්නේ ළමා ගණිකා වෘත්තිය නිවාරණය කිරීම සම්බන්ධයෙන් දිගු කාලීන හා කෙටි කාලීන විසඳුම් අවශ්‍ය බව යි. කෙටි කාලීන විසඳුම් වශයෙන් ළමා ගණිකා වෘත්තිය හා අපයෝජනය සම්බන්ධයෙන් නෛතික ක්‍රියාකාරිත්වය පවත්නා තත්ත්වයට වඩා සක්‍රීය විය යුතු ය. ළමුන්ගේ සුභ සිද්ධිය උදෙසා නීති සම්පාදනය වී ඇතත් ඒවා ක්‍රියාවට නංවන ආයතන (පොලීසිය, පරිවාස හා ළමාරක්ෂක කාර්යාල, ලංකා සංචාරක මණ්ඩලය වැනි) මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නේ උදාසීන ලෙසිනි. අනෙක් අතට ළමුන් අපයෝජනයට ඇති ඉඩකඩ වළක්වනු වස් ළමුන්, දෙමාපියන් සහ වැඩිහිටියන් දැනුවත් කිරීම ද අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ඒ ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක ස්වේච්ඡා සංවිධානවල සහාය ලබා ලැනීම වැදගත් ය. දීර්ඝ කාලීන විසඳුම් වශයෙන්, දැනට ම ත් අපචාරිත්වයට නැඹුරු වී ඇති සහ අපයෝජනයට ලක් වී ඇති ළමුන් ක්‍රමානුකූල පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය ය (කෙසේ වුව ද මෙම ළමුන් සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ වැරැදිකරුවන් සේ සලකා නො ව අහිංසක පිරිසක් ලෙසිනි). පවුල් සංස්ථාවේ බිඳ වැටීම් හා සංඝටනකාරී තත්ත්වයන් හමුවේ නිවසින් පිටත සම්බන්ධතාවන් කෙරෙහි ළමුන් යොමුවීම වළක්වනු වස් සැලකිය යුතු මට්ටමින් ප්‍රජා හා පවුල් උපදේශන සේවා/සමාජ සජීවීකරණ වැඩ සටහන් පැවැත්විය යුතු අතර ඒවාහි ප්‍රගතිය විටින් විට ඇගයීමකට ලක් කළ යුතු වේ. පාසැල් අධ්‍යාපනය ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙන ළමුන් පිළිබඳ මනා සොයා බැලීමක් කළ යුතු අතර ඔවුන්ට ඇති බාධක ඉවත් කිරීමෙහි ලා ක්‍රමවත් වැඩ පිළිවෙලක් තිබිය යුතු ය. (පිරිමි) ළමා ගණිකා වෘත්තිය නිවාරණය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය ය. එ පමණක් නො ව මේ සම්බන්ධයෙන් දිගින් දිගට ම පර්යේෂණ පැවැත්වීම ද කළ යුතු ය යන යෝජනාවන් මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් දැක්විය යුතු ය.